**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

**<u>කෑගල්ල දිස්ත්‍රික්කය</u>**

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පිරිවැය රු.144,122 ක් වූ ලිදක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) 1996 වර්ෂයේ රු. 150,000 කට මිලදී ගෙන තිබූ වාහනයක් ගිණුම්ගතකර නොතිබීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ඉටුකළ කර්මාන්ත දෙකක් හා පොදු අරමුදල් යටතේ ඉටුකළ කර්මාන්ත වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන පිළිවෙලින් රු. 22,279 ක් හා රු. 406,489 ක් අඩුවෙන් සලසා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

--------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ගිණුමේ ශේෂය රු.11,787,120 ක් වූ අතර උපයෝගී ලේඛන / වාර්තා අනුව ශේෂය රු.11,768,016 ක් වූයෙන් රු. 19,104 ක වෙනසක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.47,726,000 ක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානය ට වර්ෂ 01 ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 17,721,407 ක් විය.

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත | 20,000 | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත වසර තුනකට වරක් පරිසර බලපත්‍ර අළුත් කළයුතු වුවත් ව්‍යාපාර ආයතන 05 ක් විසින් පරිසර බලපත්‍ර අළුත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මු.රෙ. 371(ඇ) | | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත් පුද්ගලයා විසින් අදාල කාර්යය අවසන් වූ වහාම අත ඉතිරි වූ මුදල එදිනම හෝ ඊලඟ වැඩකරන දිනයේ පියවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 571 | 476,954 | 1999 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

සභාවට අයත් වාහන 24 කට අදාල ධාවන සටහන් 2013 වර්ෂයේ සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) මු.රෙ.1646

583,556

-

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 47,963,860 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 33,446,236 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017<br>ඇස්තමේන්තුගත ආදායම<br>රු. | 2017<br>බිල්කළ ආදායම<br>රු. | 2017<br>රැස්කළ ආදායම<br>රු. | 2017<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | 2016<br>ඇස්තමේන්තුගත ආදායම<br>රු. | 2016<br>බිල්කළ ආදායම<br>රු. | 2016<br>රැස්කළ ආදායම<br>රු. | 2016<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 15,304,000 | 11,760,000 | 7,862,000 | 10,057,000 | 14,520,055 | 13,670,137 | 6,695,002 | 12,244,384 |
| (ii) | කුලී | 27,859,400 | 26,997,000 | 23,120,000 | 6,511,000 | 22,027,400 | 20,333,993 | 18,159,446 | 1,779,899 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,675,200 | 2,350,000 | 2,350,000 | - | 1,825,200 | 7,110,568 | 1,450,000 | 111,650 |
| (iv) | වෙනත් ආදායම් | 42,672,000 | 68,079,000 | 31,917,000 | 74,495,000 | 40,979,000 | 32,913,422 | 1,225,371 | 102,625,904 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම , රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 48,17,12 හා 25 කින් අඩුවී වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු හා අක්කර බදු ශේෂය රු. 9,872,820 ක් වූ අතර ඒ තුල වර්ෂ 01 ට වැඩි ශේෂය රු. 6,159,000 ක් විය. වරිපනම් හා අක්කර බදු අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

**(ආ)** වර්ෂ 05 කට වරක් දේපල තක්සේරුවක් සිදුකළ යුතු වුවත් 2009 වර්ෂයෙන් පසුව දේපල තක්සේරු නොකිරීම හේතුවෙන් සංවර්ධන කාර්යයන් මත වාර්ෂික වටිනාකම වැඩිවන දේපල හඳුනාගෙන විශාල ආදායම් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී තිබුණි.

**(ඇ)** කොමිස් ගෙවීමේ පදනම මත බඳවාගෙන තිබුණු සේවකයන් 03 දෙනෙකු හා ආදායම් නිලධාරින් 06 දෙෙනකු විසින් හිඟ වරිපනම් බදු අයකරන නමුත් 2017 සැප්තැම්බර් 30 දිනට බදු අය කිරීමේ ප්‍රතිශතය මාසිකව සියයට 20 කට වඩා පහළ මට්ටමක පැවතුණි.

### 2.2.4 කුලී

2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව කඩ කාමර 14 කින් හිඟ කුලී වශයෙන් අයකල යුතු එකතුව රු.585,637 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

2017 වර්ෂය වෙනුවෙන් බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ආයතන 02 කින් බලපත්‍ර ගාස්තු අයවිය යුතුව තිබූ අතර ගෙවීම් පැහැර හරින්නන් වෙනුවෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි.

**2.2.6 වෙනත් ආදායම්**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 09 දිනැති අංක 1736 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සහා බල ප්‍රදේශයේ සවිකරන ස්ථාවර හා තාවකාලික දැන්වීම් පුවරු මත ගාස්තු අයකළ යුතු වුවත් දැන්වීම් පුවරු 20 ක් සඳහා ගාස්තු රු.966,400 ක් අයකර ගැනීමට හා අනවසර දැන්වීම් පුවරු සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මස් කඩ 05 ක් හා මාළු කඩයක් වර්ෂ 04 කට වැඩි කාලයක සිට බදු නොදීම මත වාර්ෂිකව රු.1,787,420 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) 2002,2003,2005 හා 2013 වර්ෂයන්ට අදාලව මස් කඩ හා මාළු කඩවල හිඟ කුළී රු.1,080,539 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,093,125 ක් හා මුද්දර ගාස්තු 26,191,148 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 කාර්ය සාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාත්මක නොකල කර්තව්‍යයන්**

-------------------------------------

පොදු අරමුදල් යටතේ කර්මාන්ත 19 ක් ඉටුකිරීමට රු. 14,838,595 ක ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ නමුත් 2018 මැයි 02 දින වනවිටත් අනුමැතිය ලැබී නොතිබීම නිසා ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

රන්දිවල හීන්නවත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙහි පොලිතීන් හා ප්ලාස්ටික් වැනි නොදිරන අපද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය අසල අක්‍රමවත්ව බැහැර කරමින් පැවතුණි.

**(ඇ) පාරිසරික ගැටළු**

------------------

මාවනැල්ල ළමා උද්‍යානය අසල පොදු වැසිකිළියෙහි වල උතුරා යමින් පැවති අතර වැසිකිළිය අවට පරිසරය අපිරිසිදුව පැවතුණි.

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍ර පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(අ)** ප්‍රාදේශීය සභාවේ ගිණි නිවීමේ ඒකකයේ සේවා ව්‍යවස්ථාව පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

**(ආ)** මාවනැල්ල බස්නැවතුම්පල පොදු වැසිකිළි වලෙහි අපද්‍රව්‍ය සහිත ජලය පිටතට කාන්දුවීම නිසා 2014 වර්ෂයේ සිට වැසිකිළිය වසාදමා ඇති බැවින් පොදු මහජනතාවට සේවා සැපයීමට මෙමඟින් අපොහොසත් වී තිබුණි.

**(ඇ)** මාවනැල්ල ළමා උද්‍යානයට අයත් පොදු වැසිකිළියෙහි ජල බිල්පත් බදුකරුගෙන් ගිවිසුම් ප්‍රකාරව අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 256,068 ක හිඟයක් පැවතුණි

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා තනතුරු වර්ග 04 ක් සඳහා සේවකයින් 06 දෙනෙකු සේවයේ යොදවා තිබූ අතර තනතුරු 15 ක පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් විය. අනුමත කාර්යමණ්ඩලයට අමතරව අනියම් පදනමින් සේවකයින් 46 දෙනකු බඳවාගෙන තිබුණි.

**(ආ)** 2005 වර්ෂය හා 2014 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළ ස්ථාන මාරු, විශ්‍රාම ගිය හා අතුරුදහන් වූ සේවකයන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 69,784 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** රු.1,926,900 ක් වටිනා සභාවට අයත් ලොරි රථ දෙකක් වර්ෂ 02 සිට වර්ෂ 10 දක්වා නිශ්කාර්යව පැවතිණි.

**(ආ)** වාහන 35 සඳහා රියදුරන් 18 දෙනෙකු පමණක් සේවය කරන බැවින් වාහන ඌන උපයෝජනයක් පැවතුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** සමාලෝචිත වරෂයේ අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 56 ක එකතුව වූ රු. 43,764,540 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 06 ක එකතුව වූ රු. 12,675,000 ක ප්‍රතිපාදන වලින් සියයට 85 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක් වූ එකතුව රු. 56,439,540 ක් උපයෝජනය කර නොතිබුණි.

**(ආ)** ආදායම් විෂයයන් 17 ක ඇස්තමේන්තුගත ආදායම රු. 11,650,000 ක් වූ අතර තථ්‍ය ආදායම රු.4,840,363 ක් විය. අයවැයගත ආදායමට සාපේක්ෂව එකී ආදායම් ශීර්ෂ වල ආදායම් අය කිරීම සියයට 06 සිට සියයට 67 දක්වා පරාසයකින් අඩුවී තිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | අත්තිකාරම් ලේඛනය නිසිපරිදි යාවත්කාලීන නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) වරිපනම් සඳහා දේපල තක්සේරුව නිසිපරිදි නොකිරීම<br>(ii) හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| (ඇ) | අයවැය පාලනය | (i) ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරියක් තිබීම<br>(ii) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම<br>(ii) වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම |
| (ඉ) | කසළ කළමනාකරණය | ක්‍රමවත්ව කසළ බැහැර නොකිරීම |

.